# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1772/36 - 2012 අගෝස්තු මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2012.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස : පළාත් සභා

## පළාත් සභා නිවේදන

### යටිනුවර ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (1) වැනි උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (vii) උපවගන්තියේ ඌ ජේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව යටිනුවර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික) විධිවිධාන පනතේ 2 වැනි වගන්තිය (I)(අ) වැනි උපවගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම ගැසට් නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා
පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2012 ජූලි මස 06 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

### යටිනුවර ප්‍රාදේශීය සභාව

*කුලී රථවාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව*

01. මෙම අතුරු ව්‍යවස්ථාව යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුලී රථ නවතා තැබීම පාලනය කිරීම, විධිමත් කිරීම සහ ගාස්තු අයකර ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. ප්‍රාදේශීය සභාව විසින් අනුමතකර සභාපතිවරයා විසින් නිවේදනය කරනු ලබන මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන ස්ථානවල හැර වෙනත් කිසිදු පොදු ස්ථානයක මෝටර් රථයක් කුලියට ධාවනයේ යෙදවීමේ අරමුණ ඇතිව නවතා තැබීම නොකළ යුතු ය. සභාවේ යෝජනා සම්මුතියක් මගින් එම ස්ථාන සංශෝධනය කිරීම සහ නව ස්ථාන නම් කිරීම කරනු ලැබිය හැකිය.

03. යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 02 වැනි අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පළමු උපලේඛනයේ සඳහන් ස්ථානවල දෙවැනි උපලේඛනයේ දැක්වෙන ගාස්තුවක් සහ ඊට අදාළ රජයේ ගාස්තුත් සභාවට වාර්ෂිකව ගෙවීමෙන් එකී ස්ථානවල කුලී රථවාහන නවතා තැබීම කළ යුතු අතර එම කුලී රථවාහන සභාවේ ලියාපදිංචි කළ යුතු ය. එම ගාස්තු ද සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකිය. එම සංශෝධිත ගාස්තු ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු වලංගු වන්නේය.

04. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකුගෙන් ලබාගත් බලපත්‍රය යටතේ හැර කිසිදු තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන රථවාහන නැවතුම්පලවල මෝටර් රථ වාහන නවතා තැබීම නොකළ යුතු අතර මෙය පෙරවරු 6.00 සිට පස්වරු 7.00 දක්වා ක්‍රියාත්මක වනු ඇත. උපලේඛන අංක 01 අනුව නව නැවතුම් ස්ථානයක් ඇති කිරීමේ දී මහ සභා යෝජනා ස්ථිරත්වයක් ලබාගත යුතුයි.

05. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකු විසින් හෝ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරනු ලැබූයේ එක් ලිත් වර්ෂයක් වෙනුවෙන් ද ඒ වර්ෂයේ අවසන් දිනයෙන් එහි වලංගු කාලය අවසන් වේ.

06. බලපත්‍රය ලබාගැනීම සඳහා තුන්වැනි උපලේඛනයේ ප්‍රකාර යටිනුවර ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන අයදුම්පතක් මගින් සභාපතිවරයා වෙත අයිතිකරු හෝ රියැදුරු විසින් අයදුම් කළ යුතු ය.

07. රථවාහන නවතා තැබීමේ ස්ථානයක නවතා තැබූ වාහනයක් අයිතිකරු හෝ රියැදුරු වෙත එම වාහනය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ බලපත්‍රය ඉදිරිපත් කරන ලෙස රථවාහන පාලකවරයෙකු හෝ එම කාර්යය සඳහා සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් ඉල්ලනු ලබන කවර හෝ අවස්ථාවක ඒ අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

08. සෑම අවුරුද්දකම ජනවාරි මස 31 දිනට පෙර අදාළ අවුරුද්ද සඳහා රථ වාහන නවතා තැබීමේ බලපත්‍රය ලබාගෙන තිබිය යුතු ය.

09. යටිනුවර ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව කිසිදු මෝටර් රථයක් කුලී රථවාහන නවතා තැබීමේ නැවතුම් පොළකට ඇතුල් කිරීම නොකළ යුතු ය.

10. ස්ථිර වශයෙන් හෝ දින 14කට නොඅඩු කාලයක් අඛණ්ඩව කුලී රථවාහන නැවතුම්පලකින් වාහනයක් ඉවත්කර ගන්නේ නම් ඉවත් කරගත් වහාම ඒ බව සභා කාර්යාලයට දැන්විය යුතු ය. එසේ දැන්වීමක් නොකළහොත් අදාළ වාර්ෂික ගාස්තුව ගෙවිය යුතු ය.

11. කුලී රථවාහන, නැවතුම්පල තුළ දී කිසියම් වාහනයක් අලුත්වැඩියා කිරීම හෝ සේදීම හෝ වෙනත් අයකු ලවා සේදීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

12. යම් තැනැත්තෙකු කුලී රථවාහන නවතා තැබීමේ ස්ථානයක හෝ වාහනයක් ඇතුළත හෝ බීමත්ව හෝ අනිසි ලෙස හෝ අශෝභන ලෙස හැසිරීම හෝ හිරිහැරයක් වනසේ හැසිරීම නොකළ යුතු ය.

13. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උපවගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

14. නිසි බලය ඇති අධිකරණයක් විසින් නියම කරනු ලැබූ වෙනත් යම් දඩුවමකට සහ/හෝ දඩයකට අමතරව මෙම අතුරු ව්‍යවස්ථාව කඩකිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ අයෙකුගේ ලියාපදිංචිය අවලංගු කිරීම නීත්‍යානුකූල වන අතර එසේ අවලංගු කිරීම වෙනුවෙන් කිසිදු වන්දියක් ලැබීමට ඔහුට හිමිකමක් නොමැත්තේ ය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"සභාව" යන්නෙන් යටිනුවර ප්‍රාදේශීය සභාව ද,
"සභාපති" යන්නෙන් යටිනුවර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,
"බලය පවරනු ලැබූ නිලධාරියා" යන්නෙන් යටිනුවර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු ද,
"රථවාහන පාලක" යන්නෙන් යටිනුවර ප්‍රාදේශීය සභාව විසින් රථවාහන පාලනය කිරීම සඳහා පත්කර සිටින නිලධාරියෙකු අදහස් වේ.
"මෝටර් රථය හෝ කුලී රථය" යන්නෙන් රෝද රථයක්, ලොරියක්, වෑන් රථයක්, ට්‍රැක්ටරයක්, ට්‍රක් රථයක්, කාර් රථයක්, අත් ට්‍රැක්ටරයක් යනුවෙන් අදහස් කරේ.

මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බල පැවැත්වේ.

*උපලේඛන අංක 01*

1. පේරාදෙණිය නගරයේ පේරාදෙණිය - ගැටඹේ මාර්ගයේ (හෙක්ටර් කොබ්බෑකඩුව මාර්ගය) දකුණුපස හන්දියේ සිට මීටර් 30ක්.
2. පේරාදෙණිය නගරයේ - කෙන්හින්ද පාර ආරම්භයේ සිට වම් පැත්තට මීටර් 20ක්.
3. පේරාදෙණිය - ගැටඹේ මාර්ගයේ (හෙක්ටර් කොබ්බෑකඩුව මාවත) ගොරකාදෙණිය හන්දියට ඉදිරියෙන් දකුණුපස 1/4 හා 1/5 බෝක්කු කණුව අතර හා තේශක්ති කාර්යාල ගොඩනැගිල්ල මායිමේ සිට මීටර් 12ක්.
4. පේරාදෙණිය ගැටඹේ මාර්ගයේ (හෙක්ටර් කොබ්බෑකඩුව මාවත) 3/2 බෝක්කුව අසල සිට දකුණුපස මීටර් 10ක්.
5. පේරාදෙණිය ගැටඹේ මාර්ගයේ (හෙක්ටර් කොබ්බෑකඩුව මාවත) සෝයාහන්දිය වම්පස 2/6 බෝක්කුව අසල සිට මීටර් 30ක්.
6. පේරාදෙණිය ගැටඹේ මාර්ගයේ (හෙක්ටර් කොබ්බෑකඩුව මාවත) හදබිම අධිකාරිය කාර්යාලය ඉදිරිපිට හන්දියේ සිට ගුහාගොඩ කටුගස්තොට මාර්ගය දෙසට දකුණුපස මීටර් 20ක්.
7. පහල ඊරියගම හන්දියේ ප්‍රගති මාවත දෙසට දකුණුපස ආරම්භයේ සිට මීටර් 20ක්.
8. පොල්ගහමුල හන්දියේ අලදෙණිය මාර්ගය දෙසට වම්පස මීටර් 25ක් දුරින් ආරම්භයේ සිට මීටර් 20ක්.
9. පොල්ගහමුල ඒදඩුවාව හන්දියේ සිට මීටර් 10ක් දුරින් ආරම්භයේ සිට මීටර් 20ක්.
10. කෙහෙල්වල හන්දියේ, කෙහෙල්වල පන්සල දෙසට මාර්ගයේ ආරම්භයේ සිට මීටර් 10ක්.
11. කිරිබත් කුඹුර ඕවල හන්දියේ ඕවල දෙසට වම්පස මාර්ගයේ ආරම්භයේ සිට මීටර් 20ක්.
12. කිරිබත් කුඹුර නගරයේ වතුරකුඹුර මාර්ගයේ වම්පස ආරම්භයේ සිට මීටර් 20ක්.
13. ගන්නොරුව මුරුතලාව මාර්ගයේ බහුකාර්ය ශාලාව ඉදිරිපිට වම්පස හන්දියේ සිට මුරුතලාව දෙසට මීටර් 17ක්.
14. ගන්නෝරුව - මුරුතලාව මාර්ගයේ පූට්ටුපාලම අසල - පුෂ්පාරාම පන්සල මාවත දෙසට දකුණුපස ආරම්භයේ සිට මීටර් 12ක්.
15. මුරුතලාව නගරයේ හතරමං හන්දිය අසල සිට දකුණුපස සිට පොල්හගමුල දෙසට මීටර් 25ක්.
16. මුරුතලාව නගරයේ ග්‍රාමීය බැංකුව අසල වම්පස අලදෙනිය දෙසට මීටර් 20ක්.
17. කම්බිඅඩිය හන්දියේ දකුණුපස ආරම්භයේ සිට මුරුතලාව නගරය දෙසට මීටර් 10ක්.
18. යහලතැන්න හන්දියේ සිට මුස්ලිම් පල්ලිය ඉදිරිපිට වම්පස අලදෙණිය දෙසට මීටර් 20ක්.
19. පොල්ගහමුල - අලදෙණිය මාර්ගයේ ඉළුක්තැන්න හන්දියේ ආරම්භයේ සිට වම්පස පොල්ගහමුල දෙසට මීටර් 20ක්.
20. පොල්ගහමුල - අලදෙණිය මාර්ගයේ පිලපිටිය බෝධිය අසල ඉදිරිපිට සිට දකුණුපස අලදෙණිය දෙසට ආරම්භයේ සිට මීටර් 15ක්.
21. පොල්ගහමුල අලදෙණිය මාර්ගයේ 5 කණුව අසල හන්දියේ ඉදිරිපිට ආරම්භයේ සිට පොල්ගහමුල දෙසට මීටර් 10ක්.
22. කිරිබත්කුඹුර - වතුරකුඹුර මාර්ගයේ බුළුමුල්ල හන්දියේ ගිරාකාංග දෙසට දකුණුපස සිට ආරම්භයේ සිට මීටර් 10ක්.
23. කිරිබත්කුඹුර - වතුරකුඹුර මාර්ගයේ සූරියගොඩ හන්දියේ වම්පස ආරම්භයේ සිට සූරියගොඩ දෙසට මීටර් 10ක්.
24. කිරිබත්කුඹුර - වතුරකුඹුර මාර්ගයේ මොලදණ්ඩ හන්දියේ බස් නැවතුම් ස්ථානයේ සිට වම්පස වතුරකුඹුර දෙසට මීටර් 10ක්.
25. කිරිබත්කුඹුර - වතුරකුඹුර මාර්ගයේ ඉඩම්පිටිය හන්දිය සිට වම්පස කිරිබත්කුඹුර දෙසට මීටර් 10 ක්.
26. දියපලාගොඩ හන්දියේ ආරම්භයේ සිට පැපොලංග දෙසට වම්පසට මීටර් 20ක්.
27. ගොඩමුදුන හන්දියේ ආරම්භයේ සිට දකුණුපස වතුරකුඹුර දෙසට මීටර් 20ක්.
28. වතුරකුඹුර පාසල් මාවත අසල හන්දිය.
29. වතුරකුඹුර වැවතැන්න හන්දියේ ආරම්භයේ සිට දකුණුපස වැවතැන්න දෙසට මීටර් 10ක්.
30. කහවතුගොඩ හන්දියේ ආරම්භයේ දකුණුපස සිට කහවතුගොඩ දෙසට මීටර් 10ක්.
31. ගිරාගම තේ කම්හල අසළ නාගොල්ලාගම දෙසට දකුණුපස ආරම්භයේ සිට මීටර් 10ක්.
32. පාරකැටවැල්ල හන්දියේ පිළිමතලාව දෙසට ප්‍රධාන මාර්ගයේ වම්පස ආරම්භයේ සිට.
33. සියඹලාගොඩ හන්දියේ ආරම්භයේ සිට දකුණුපස පිළිමතලාව දෙසට මීටර් 15ක්.
34. දන්තුරේ නගරයේ උඩවෙල පාර හැරෙන හන්දියේ වම්පස ආරම්භයේ සිට මීටර් 20ක්.
35. දඹගොඩ හන්දියේ ආරම්භයේ සිට වම්පස දඹගොඩ දෙසට මීටර් 8ක්.
36. වල්ගම්පාය හන්දියේ ආරම්භයේ සිට වම්පස දන්තුරේ නගරය දෙසට මීටර් 30ක්.
37. වල්ගොව්වාගොඩ හන්දියේ වල්ගොව්වාගොඩ දෙසට මාර්ගයේ වම්පස පැත්තට ආරම්භයේ සිට මීටර් 30ක්.
38. රත්තේපිටිය හන්දිය ප්‍රධාන මාර්ගයේ පොත්තපිටිය දෙසට යනවිට වම්පස වත්තට ප්‍රධාන මාර්ගයේ මීටර් 50ක් පමණ.
39. කැටපිටිය හන්දිය, ආඩියාතැන්න මාර්ගයේ දකුණුපසට වත්තට මීටර් 30ක් පමණ.
40. මැණික්දිවෙල හන්දිය, පාසල ඉදිරිපිට ප්‍රධාන මාර්ගයේ පොත්තපිටිය දෙසට දකුණු පැත්තේ මීටර් 20ක් පමණ.
41. පොත්තපිටිය නගරය බස්රථ නැවතුම්පොල ඉදිරිපිට මාර්ගයේ පිළිමතලාව දෙසට මාර්ගයේ වම්පස මීටර් 50ක් පමණ.
42. දොඩම්වල දේවාලයේ මළුව ඉදිරිපිට මාර්ගයේ මීටර් 15ක් පමණ.
43. පැපොලංග හන්දිය පාසල දෙසට ඇති මාර්ගයේ දකුණු පැත්තට මීටර් 20ක් පමණ.
44. උඩවල පාසල අසල බස්රථ හරවන ස්ථානයේ මීටර් 10ක් පමණ.
45. කොළඹ - නුවර මාර්ගයේ සිට බෝයගම දෙසට යන මාර්ගයේ ආරම්භයේ සිට දකුණු පැත්තේ මීටර් 30ක්.
46. කොළඹ - නුවර ප්‍රධාන මාර්ගයේ දේවධර්ම ශාස්ත්‍රාලය දෙසට වත්තට බස් නැවතුම්පල අතහැර මීටර් 10ක් පමණ.
47. කොළඹ - නුවර ප්‍රධාන මාර්ගයේ සිට හීරැස්සගල මාර්ගයේ වම් පසට වත්තට මීටර් 10ක්.
48. කොළඹ - නුවර ප්‍රධාන මාර්ගයේ පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල අසල බෝක්කු අංක 106/4 දරන බෝක්කුව අසල මීටර් 10ක් පමණ.

49. දෙහිඅංග පල්ලිය ඉදිරිපිට මාර්ගයේ මීටර් 20ක් පමණ.
50. දෙහිඅංග නගර මධ්‍යයේ බස්නැවතුම ඉදිරිපිට මාර්ගයේ මීටර් 20ක් පමණ.
51. දඹලන්ද හන්දිය බුදුමැදුර අසල සිට කුරුඳුවත්ත පාර අතහැර ප්‍රධාන මාර්ගයේ මීටර් 10ක් පමණ.
52. මුංවතුගොඩ පල්ලියට හැරෙන හන්දියේ සිට පල්ලිය දෙසට මාර්ගයේ මීටර් 10ක් පමණ.

*උපලේඛන අංක 02*

| | | වාර්ෂික බලපත්‍ර ගාස්තු ප්‍රමාණය රු. ශ. |
|---|---|---|
| (අ) | ලොරියක් සඳහා | 1,000.00 |
| (ආ) | වෑන් රථයක් සඳහා | 1,000.00 |
| (ඇ) | ට්‍රේලරයක් සහිත ට්‍රැක්ටරයක් සඳහා | 1,000.00 |
| (ඈ) | කාර් එකක් සඳහා | 900.00 |
| (ඉ) | අත් ට්‍රැක්ටරයක් සඳහා | 600.00 |
| (ඊ) | ත්‍රීරෝද රථයක් සඳහා | 600.00 |

*උපලේඛන අංක 03*

**යටිනුවර ප්‍රාදේශීය සභාව**

**බලපත්‍රය සඳහා අයදුම්පත්‍රය**

1. වාහනයේ අංකය සහ වර්ගය : ..........................................................
2. අයිතිකරුගේ නම, හැඳුනුම්පත් අංකය : ..........................................................
3. ලිපිනය : ..........................................................
4. රියැදුරුගේ නම : ..........................................................
5. රියැදුරුගේ හැඳුනුම්පත් අංකය : ..........................................................
6. රියැදුරු බලපත්‍ර අංකය : ..........................................................
7. ලිපිනය : ..........................................................
8. වාහනය නවතා තැබීමට ඉල්ලන ස්ථානය : ..........................................................
9. වාහනය පාවිච්චි කළ හැක්කේ කුමන කාර්යයක් සඳහා ද : ..........................................................
10. එහි ධාරිතාව - ප්‍රමාණය : ..........................................................

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

..........................................................
අයදුම්කරු/රියැදුරු අත්සන.

දිනය : ..........................................................

**ආදායම් පරීක්ෂකගේ වාර්තාව**

01. නැවතුම් පොළ පිළිබඳ විස්තර : ..........................................................
02. බලපත්‍ර ගාස්තුව : ..........................................................

.......................................................... වර්ෂයට බලපත්‍ර ලබාදීම නිර්දේශ කරමි./ නොකරමි.

..........................................................
ආදායම් පරීක්ෂක.

*සභාපතිතුමාගේ නිර්දේශය :*

ඉහත වාර්තාව අනුව බලපත්‍ර ලබාදීම අනුමත කරමි./නොකරමි.

සභාපති,
යටිනුවර ප්‍රාදේශීය සභාව,

දිනය : ..........................................................

09 - 213/1

**රත්තොට ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (1) වැනි උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (vii) උපවගන්තියේ ඌ ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව රත්තොට ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික) විධිවිධාන පනතේ 2 වැනි වගන්තිය (I)(අ) වැනි උපවගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම ගැසට් නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව රත්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා
පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2012 ජූලි මස 12 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**රත්තොට ප්‍රාදේශීය සභාව**

***කුලී රථවාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව***

01. මෙම අතුරු ව්‍යවස්ථා රත්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුලී රථ නවතා තැබීම පාලනය කිරීම, විධිමත් කිරීම සහ ගාස්තු අයකර ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. ප්‍රාදේශීය සභාව විසින් අනුමත කර සභාපතිවරයා විසින් නිවේදනය කරනු ලබන මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන ස්ථානවල හැර වෙනත් කිසිදු පොදු ස්ථානයක මෝටර් රථයක් කුලියට ධාවනයේ යෙදවීමේ අරමුණු ඇතිව නවතා තැබීම නොකළ යුතු ය. සභාවේ යෝජනා සම්මුතියක් මගින් එම ස්ථාන සංශෝධනය කිරීම සහ නව ස්ථාන නම් කිරීම කරනු ලැබිය හැකිය.

03. රත්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ රථවාහන නවතා තැබීමේ අතුරු ව්‍යවස්ථානුකූලව රත්තොට නගර සීමාව තුළ පළමු උපලේඛනය දක්වා ඇති අ.ආ.ඇ. යන ස්ථාන සඳහා තෙවැනි උපලේඛනයේ සඳහන් පරිදි නවතා තැබීමේ ලියාපදිංචි ගාස්තු අයකරනු ලැබේ.

04. රත්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වන දෙවැනි උපලේඛනයේ සඳහන් ස්ථාන සඳහා හතරවැනි උපලේඛනය පරිදි වාර්ෂික ලියාපදිංචි ගාස්තුවක් හා වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකරනු ලැබේ.

05. මෙම අතුරු ව්‍යවස්ථාව අනුව රත්තොට නගර සීමාව තුළ කුලී රථ ලෙස ධාවනයට යොදවා ඇති ත්‍රීරෝද රථ, ලොරි රථ, වෑන් රථ සඳහා දෛනිකව ගාස්තු ගෙවා ලබාගත් ලදුපත රියැදුරු/බදුකරු/අයිතිකරු ඒ අවස්ථාවේ ලඟ තිබිය යුතු ය.

06. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකුගෙන් ලබාගත් බලපත්‍රය යටතේ හැර කිසිදු තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන රථවාහන නැවතුම්පොළවල මෝටර් රථවාහන නවතා තැබීම නොකළ යුතු අතර මෙය පෙරවරු 6.00 සිට පස්වරු 7.00 දක්වා ක්‍රියාත්මක වනු ඇත.

07. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තකු විසින් හෝ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරනු ලැබූයේ එක් ලිත් මාසයක් වෙනුවෙන් ද ඒ මාසයේ අවසන් දිනයෙන් එහි වලංගු කාලය අවසන් වේ.

08. බලපත්‍ර ලබාගැනීම සඳහා තුන්වැනි උපලේඛනයේ ප්‍රකාර රත්තොට ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන අයදුම්පතක් මගින් සභාපතිවරයා වෙත අයිතිකරු හෝ රියැදුරු විසින් අයදුම් කළ යුතු වේ.

09. රථවාහන නවතා තැබීමේ ස්ථානයක නවතා තැබූ වාහනයක් අයිතිකරු හෝ රියදුරු වෙත එම වාහනය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ බලපත්‍රය ඉදිරිපත් කරන ලෙස රථවාහන පාලකවරයෙකු හෝ එම කාර්යය සඳහා සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් ඉල්ලනු ලබන කවර හෝ අවස්ථාවක ඒ අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

10. සෑම මසකම පළමුවැනි දිනට පෙර අදාළ මාසය සඳහා රථ වාහන නවතා තැබීමේ බලපත්‍රය ලබාගෙන තිබිය යුතු ය.

11. රත්තොට ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව කිසිදු මෝටර් රථයක් කුලී රථ වාහන නවතා තැබීමේ නැවතුම්පොළකට ඇතුල් කිරීම නොකළ යුතු ය.

12. ස්ථිර වශයෙන් හෝ දින 14 කට නොඅඩු කාලයක් අඛණ්ඩව කුලී රථ වාහන නැවතුම්පළකින් වාහනයක් ඉවත්කර ගන්නේ නම් ඉවත් කරගත් වහාම ඒ බව සභා කාර්යාලයට දැන්විය යුතු ය. එසේ දැන්වීමක් නොකළහොත් අදාළ මාසික ගාස්තුව ගෙවිය යුතු ය.

13. කුලීරථ වාහන, නැවතුම්පොළ තුළ දී කිසියම් ස්ථානයක් අළුත්වැඩියා කිරීම හෝ සේදීම හෝ වෙනත් අයෙකු ලවා සේදීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

14. යම් තැනැත්තෙකු කුලීරථ වාහන නවතා තැබීමේ ස්ථානයක හෝ වාහනයක් ඇතුළත හෝ බීමත්ව හෝ අනිසි ලෙස හෝ අශෝභන ලෙස හෝ හැසිරීම හෝ හිරිහැරයක් වනසේ හැසිරීම නොකළ යුතු ය.

15. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඬය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උපවගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

16. නිසි බලය ඇති අධිකරණයක් විසින් නියම කරනු ලැබූ වෙනත් යම් දඬුවමකට සහ / හෝ දඩයකට අමතරව මෙම අතුරු ව්‍යවස්ථාව කඩකිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ අයෙකුගේ ලියාපදිංචිය අවලංගු කිරීම නීත්‍යානුකූල වන අතර එසේ අවලංගු කිරීම වෙනුවෙන් කිසිදු වන්දියක් ලැබීමට ඔහුට හිමිකමක් නොමැත්තේ ය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"සභාව" යන්නෙන් රත්තොට ප්‍රාදේශීය සභාව ද,

"සභාපති" යන්නෙන් රත්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"බලය පවරනු ලැබූ නිලධාරියා" යන්නෙන් රත්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු ද,

"රථ වාහන පාලක" යන්නෙන් රත්තොට ප්‍රාදේශීය සභාව විසින් රථවාහන පාලනය කිරීම සඳහා පත්කර සිටින නිලධාරියෙකු අදහස් වේ.

"මෝටර් රථය හෝ කුලී රථය" යන්නෙන් ත්‍රීරෝද රථයක්, ලොරියක්, වෑන්රථයක්, ට්‍රැක්ටරයක්, ට්‍රක් රථයක්, කාර් රථයක්, අත් ට්‍රැක්ටරයක් යනුවෙන් අදහස් කරේ.

මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බල පැවැත්වේ.

මධ්‍යම පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලදී.

*උපලේඛන 01*

***සළකුණු කර ඇති ස්ථාන (ත්‍රීරෝද රථ)***

1. පුංචි රත්තොට නගරය (පල්ලිය අසල) අඩි 60, අංක 108 දරන කඩකාමරය සිට මුස්ලිම් පල්ලිය දක්වා (දකුණු පස),
2. 1. රන්ජන් විජේරත්න මාවත අඹගහ අසල සිට පෙට්ටි කඩ අවසානය දක්වා අඩි 33 (දකුණු පස),
3. ජනක බණ්ඩාර තෙන්නකෝන් මාවත අඩි 103,

   1. ජනක තෙන්නකෝන් මාවත 53/11 දරන කඩ කාමරය ඉදිරිපිට සිට ජනක බණ්ඩාර තෙන්නකෝන් මාවත අංක 18 දරන කඩ කාමරය දක්වා අඩි 103 (වම් පස),
4. ටී. ඩී. ජයරත්න මාවත (කඩ කාමර ඉදිරිපිට) ටී. ඩී. ජයරත්න මාවත කඩ කාමර අංක 04 සිට 08 දක්වා අඩි 40 (දකුණු පස),

5. නිකලොය පාර ලතා ස්ටුඩියෝ අසල සිට නව වෙළඳ සංකීර්ණය අංක 07 කඩ කාමරය දක්වා අඩි 86 (වම් පස),
6. ගම්මඩුව පාර ජංගම මාළු කඩය ළඟ සිට අංක 10 දරන බැටරි අළුත්වැඩියා කරන ස්ථානය දක්වා අඩි 100 (දකුණු පස),
7. රත්තොට ගණදෙවි කෝවිල අසල කොටස අඩි 40 (දකුණු පස),
8. කුරුවාව පැල තවාන අසල කුරුවාව ආයුර්වේද බෙහෙත් ශාලාව හා බස් නැවතුම්පළ දක්වා අඩි 25 (වම් පස),
9. රත්තොට මාතලේ පාර අංක 35 - 37 දක්වා කඩ කාමර අසළ අඩි 20 (වම් පස),
10. අඹගහතැන්න නගරය අඩි 59, මනුමින් කේටර්ස් කඩය සිට දසනායක ස්ටෝර්ස් කඩය දක්වා,
11. කම්බිඅඩිය හන්දිය අඩි 120, බස්නැවතුම්පොළ සිට 88 දුරකථන කුළුණ දක්වා,
12. කයිකාවල කොස්වන හන්දිය අඩි 90, බස්නැවතුම්පොළ සිට විදුලි කණුව 59.58 හා ප්‍රධාන බෝක්කුව දක්වා,
13. කයිකාවල ඉසුරුගම මාර්ගය අඩි 167, දසනායක ස්ටෝර්ස් ඉදිරිපිට විදාතා සම්පත් මධ්‍යස්ථාන පිවිසුම් පුවරුව දක්වා,
14. හුණුගල හන්දිය අඩි 60,
15. වේරගම බණ්ඩාරපොල පාර අඩි 100, බස්නැවතුම්පොළ සිට වේරගම මහතාගේ නිවස දක්වා,
16. ඉකිරියගොල්ල හන්දිය අඩි 45 සමුපකාර ගොඩනැගිල්ලේ සිට නාම පුවරුව දක්වා,
17. කයිනැක හන්දිය අඩි 80 කයිනැක ගරාජය ලඟ සිට සමාධි මාවත දක්වා,
18. කළුදැවල දේවාලය ඉදිරිපිට අඩි 60 වම්පස පිහිටි පලතුරු කඩයේ සිට රාජා මහතාගේ කඩය අසල දක්වා,
19. කිවුල හන්දිය අඩි 25, තිස්සකුමාර මහතාගේ කඩ කාමරයේ සිට මාතලේ පාරේ බෝගහමුල බෝක්කුව,
20. බණ්ඩාරපොල හන්දිය අඩි 25, මා/බණ්ඩාරපොළ විදුහල අසල ගේට්ටුව,
21. අල්වත්ත හන්දිය අඩි 60,
22. තඹලගල හන්දිය අඩි 50, සිග්නේෂරන් මහතාගේ කඩයේ සිට තඹලගල අංක 03 ලයින් කාමර දක්වා,
23. කඹරගල හන්දිය අඩි 40, වෙල්ලසාමි මහතාගේ නිවස ඉදිරිපිට විදුලි කණු දෙක අසළ කොටස,
24. පිටකන්ද හන්දිය අඩි 40, විජේන්ද්‍රන්ගේ කඩය අසල සිට සව්ක්කු ගස දක්වා,
25. මුවන්දෙණිය හන්දිය අඩි 50, යෝජිත තැපැල් කාර්යාලය අසල,
26. වැටැස්යාය හන්දිය අඩි 100, මුත්තෙට්ටුව හන්දිය පෙට්ටිමඩුව කඩය අසල,
27. කන්දේනුවර නගරය අඩි 100, කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානය සිට සත්‍යවේල්ගේ කඩේ ළඟට,
28. දික්කුඹුර හන්දිය අඩි 50, රණසිංහ වෙළඳසැල ඉදිරිපිට,
29. මඩකුඹුර 25 කණුව අසල අඩි 25, රත්නායක මහතාගේ නිවස සහ ඉඩම අසල,
30. නිකලොය හන්දිය අඩි 50, මිඩ්ලිස් වත්ත වම්පස ඉළුක්කුඹුර පාර,
31. රිවස්ටන් මාර්ගයේ මැදවත්ත හන්දිය අඩි 50,
32. පොල්වත්තාකන්ද හන්දිය අඩි 50, සූර්යාකඩේ අසල වම්පස,
33. දඹගොල්ල හන්දිය අඩි 25, කොරෝලිස් මුදලාලිගේ වෙළඳසැල අසල,
34. වෙරළුගස්තැන්න හන්දිය අඩි 50, 25 වංගුව රත්නායක මහතාගේ නිවස අසල,
35. වෙළන්ගහවත්ත මාර්ගයේ කොට්ටගහමුල හන්දිය අඩි 50, දමුණුපොල මහතාගේ නිවස අසල,
36. මාඋස්සාගොල්ල හන්දිය අඩි 30, මාවුස්සාගොල්ල වනරාණිය පන්සල අසල අලුත්ගෙදර කන්ද අසල,
37. වෙලන්ගහවත්ත පාසල අසල අඩි 25, බස්හෝල්ට් අසල වම්පස රජයේ විද්‍යාලය අසල,
38. අළකොළමඩ තැන්නවෙලට හැරෙන හන්දිය අඩි 50,
39. බෝගම්බර බෝධිය අසල අඩි 60, කුමාර මහතාගේ වෙළඳසැල අසල දකුණු පස,
40. කොස්වාන පාලම අසල අඩි 100, කොස්වාන දකුණ හා ගන්සරපොලට යන හන්දිය රජයේ නිවාස.

(අ) **සළකුණු කර ඇති ස්ථාන (වෑන් රථ)**

1. ටී. ඩී. ජයරත්න මාවත ආරම්භක ස්ථානය හා මාතලේ පාර අංක 53 දරන කඩකාමරය දක්වා අඩි 66යි (වම් පස).

(ආ) **සළකුණු කර ඇති ස්ථාන (ලොරි රථ)**

1. රත්තොට මාතලේ පාර අංක 25 -35 දරන කඩකාමර දක්වා අඩි 125 (වම් පස),
2. මැල්ලගොල්ල පාර හන්දියේ සිට 30/2 ජෝසප් මහතාගේ නිවස දක්වා අඩි 400 (වම් පස).

*උපලේඛන 02*

***කුලී රථ ගාල් කිරීමේ ඉල්ලුම්පත්‍රය***

1. අයිතිකරුගේ නම : ..........................................................
2. අයිතිකරුගේ ලිපිනය : ..........................................................
3. වාහන වර්ගය හා වාහනයේ වෙළඳ නාමය : ..........................................................
4. වාහන අංකය : ..........................................................
5. රියදුරුගේ නම : ..........................................................
6. රියදුරුගේ ලිපිනය : ..........................................................
7. රියදුරුගේ හැඳුනුම්පත් අංකය සහ රියදුරු බලපත්‍රයේ අංකය : ..........................................................
8. රියදුරු සහායකයෙකු සිටින්නේ නම් ඔහුගේ නම හා ලිපිනය : ..........................................................
9. වාහනය නවතා තැබීම සඳහා ඉල්ලන ස්ථානය : ..........................................................
10. වාහනය පාවිච්චි කරන්නේ කුමන කාර්යයන් සඳහා ද : ..........................................................
11. වාහනයේ ධාරිතාවය / ප්‍රමාණය : ..........................................................
12. අයිතිකරු තහවුරු කිරීමට අදාළව ඉදිරිපත් කර ඇති ලියකියවිලි ඡායා පිටපත : ..........................................................
(ඉල්ලුම් පත්‍රය සමග අමුණා ඉදිරිපත් කරන්න.)

ඉහත සඳහන් විස්තර සත්‍ය හා නිවැරදි බවත්, අතුරු ව්‍යවස්ථාවේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට එකගවන බවත්, සහතික කරමි.

..........................................................
වාහන අයිතිකරුගේ අත්සන

දිනය : ..........................................................

*උපලේඛන 03*

| *වාහන වර්ගය* | *වාර්ෂික ලියාපදිංචි ගාස්තුව* | *බලපත්‍ර ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| (*01*) ත්‍රීරෝද රථය | 250.00 | 10.00 |
| (*02*) වෑන් රථය | 300.00 | 15.00 |
| (*03*) ලොරි රථය | 500.00 | 15.00 |
| (*04*) බස් රථය | 1,000.00 | 20.00 |

*උපලේඛන 04*

| *වාහන වර්ගය* | *වාර්ෂික ලියාපදිංචි ගාස්තුව* | *බලපත්‍ර ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| (*01*) ත්‍රීරෝද රථය | 100.00 | 500.00 |
| (*02*) වෑන් රථය | 200.00 | 750.00 |
| (*03*) ලොරි රථය | 200.00 | 750.00 |
| (*04*) පුද්ගලික බස් රථය | 300.00 | 1,000.00 |

09 - 213/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.